සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

**අවසාන වාර පරීක්ෂණය 2019 දෙසැම්බර්**
**Third Term Test, December 2019**

**11 ශ්‍රේණිය**
**Grade 11**

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II

නම/ විභාග අංකයː


සැලකිය යුතුයි ː-

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, අනෙක් ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01. (i) B අක්ෂරය ASCII කේත වගුවේ නිරූපණය වන්නේ $66_{10}$ ලෙස ය. ඒ අනුව, CAB යන වචනය නිරූපණය සඳහා වන ASCII අගය එක් අක්ෂරයට බිටු 7 බැගින් වන ද්විමය අගයක් ලෙස ප්‍රකාශ කරන්න.


(ii) නව නිපැයුමක් ලෙස සිසුවෙකු නිපැයූ ආරක්ෂිත යතුරු පැදි හිස් වැස්මක් තුළ චලන සංවේදකයක් (Motion sensor) හා ආරක්ෂක පටි සංවේදකයක් (protective Belt Sensor) ඇත. යතුරු පැදිය චලනය වන අවස්ථාවේ චලන සංවේදකය ON(1) වන අතර නතරව ඇති අවස්ථාවේ එය OFF(0) වේ. ආරක්ෂක පටිය පැළඳූ විට පටි සංවේදකය ON(1) වන අතර ආරක්ෂක පටිය පළඳා නැති විට එය OFF(0) වේ. යතුරු පැදිය චලනය වන විට ආරක්ෂිත පටිය පළඳා නැත්නම් නාදකය නාද වේ. මෙම ක්‍රියාවලිය සිදු කිරීමට අවශ්‍ය තාර්කික පරිපථය පහත දැක්වේ.




(a) තාර්කික පරිපථය සම්පූර්ණ කරන්න.

(b) මෙම පරිපථයට තුල්‍යවන සත්‍යතා වගුව අඳින්න.

(iii) පහත කෙවෙණි වලට ගැලපෙන නම, රවුම තුළින් තෝරා, අංකය සමඟ ගලපා ලියා දක්වන්න.




(iv) "ට්‍රාන්සිස්ටරය සොයා ගැනීමත් සමගම පරිගණකයේ සැකසුමෙහි විප්ලවයක් සිදුවිය." මෙම කියමන සනාථ කරණු පිණිස ට්‍රාන්සිස්ටරය මගින් අපට ලබාදුන් වාසි සහගත තත්වයන් දෙකක් පැහැදිලි කර ලියා දක්වන්න.



ictnotes.org
Scanned with CamScanner

(v) පහත සඳහන් වගුවේ A හා B තීරුවල ප්‍රකාශය හා පැහැදිලි කිරීම ගලපා, A තීරුවේ අංක ඉදිරියෙන් B තීරුවේ අක්ෂරය ලියා දක්වන්න.


| A | | B | |
|---|---|---|---|
| අංකය | ප්‍රකාශය | අක්ෂරය | පැහැදිලි කිරීම |
| 1 | ප්‍රකාශ තන්තුව යනු දැනට භාවිතාවන වේගවත්ම සන්නිවේදන මාධ්‍යය යි. | A | ලොව ඇති සියලු භාෂා, පින්තූර හා ශබ්දය එමගින් නිරූපණය කළහැකි ය. |
| 2 | නිහිත මතකය ඉතා වේගවත් ය. | B | පුළුල් පරාස ජාලයක මාර්ගයක් තුළ දෘඪ ගිනිපවුරු පිහිටුවා ඇත. |
| 3 | යුනිකෝඩ ක්‍රමය බිටු 16 ක් භාවිතා කරයි. | C | ආලෝක තරංගවලට ඉහළ සංඛ්‍යාතයක් පැවතීම හා දෝෂ අඩු වීම |
| 4 | අනවසර පිවිසීම්වලින් ජාලගත පරිගණක ආරක්ෂා කිරීමට අවශ්‍ය වේ. | D | සකසනයට අවශ්‍ය දත්ත ඉක්මනින් සැපයිය යුතු ය. |

(vi) වෙබ් පිටු සැකසීමේ දී හානිවන ග්‍රාපික සංකෝචනය ඉතා වැදගත් වන බව තම මිතුරෙකු පැවසූ බව අනිල් සිසුවා කියයි. මෙම ප්‍රකාශය සනාථ කිරීමට කරුණු දෙකක් ලියන්න.

(vii) මෙහි දැක්වෙන ව්‍යාජ කේතය සංඛ්‍යා දෙකක් සංසන්දනය කර විශාල සංඛ්‍යාව පෙන්වීම සඳහා ලියැවුණකි. එහි අඩුපාඩු තුන නිවැරදි කර ව්‍යාජ කේතය නැවත ලියා දක්වන්න.

```
BEGIN
READ A , B
    IF A > B THEN
            Large = B
    ELSE
            Large = A
    END IF
 DISPLAY
END
```

(viii) A මගින් දැක්වෙන වදන් සැකසුම් ලේඛන කොටස B මගින් දැක්වෙන ආකාරයට සකස් කිරීමේදී අංක යොදා ඇති ස්ථානවල හැඩසව් ගැන්වීම සඳහා යොදා ගන්නා ලද මෙවලම් සඳහන් කරන්න.




(ix) පරිගණක දීර්ඝ කාලීනව භාවිතා කිරීමෙන් ඇතිවිය හැකි සෞඛ්‍ය ගැටලු දෙකක් හා ඒවා වැළැක්වීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් ලියා දක්වන්න.

(x) පරිගණකය අධ්‍යාපන කටයුතු සඳහා භාවිතා කිරීමේ අවස්ථා ඉහළ යමින් පවතී. අධ්‍යාපන කටයුතු සඳහා උපකාරීවන වෙබ් අඩවි දෙකක සම්පූර්ණ වෙබ් ලිපින (URL) නිවැරදිව ලියා දක්වන්න.

ictnotes.org



Scanned with CamScanner

02. නුවරඑළිය ප්‍රදේශයේ වැවෙන මල් වර්ග විවිධ සැපයුම්කරුවන්ගෙන් මිල දී ගන්නා ලංකා ෆ්ලෝරා ආයතනය එම කාර්යයන් වඩාත් කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා පරිගණකගත දත්ත පාදකයක් භාවිත කරයි. පහත දැක්වෙන්නේ එම ආයතනය භාවිත කරන සම්බන්ධිත දත්ත පාදකයෙන් උපුටාගත් වගු කිහිපයකි.

සැපයුම්කරු වගුව (Supplier Table)

| Supp ID | S Name | Telephone No. |
|---|---|---|
| *100* | *J. Gamage* | *0772255661* |
| *101* | *L.Raja* | *0712344230* |

මල් වගාව (Flowers Table)

| Flower ID | F Name | Availability |
|---|---|---|
| *001* | *Aster* | *Yes* |
| *002* | *Azalea* | *Yes* |
| *003* | *Amaryllis* | *Yes* |

මිළදී ගැනීමේ වගුව (Purchase Table)

| FlowerID | SuppID | SupDate | Unit Price |
|---|---|---|---|
| *001* | *100* | *01/10/2019* | *3.00* |
| *001* | *101* | *03/10/2019* | *3.50* |
| *003* | *100* | *01/10/2019* | *5.00* |

(i) මෙම දත්ත සමුදාය පද්ධතිය තුළ භාවිත කළ හැකි ප්‍රාථමික යතුරු ක්ෂේත්‍රයක් හා ආගන්තුක යතුරු ක්ෂේත්‍රයක් අදාල වගුවේ නම සමඟ ලියා දක්වන්න.

(ii) තුහන්සා ලියනගේ (Thuhansa Liyanage) නම් නව සැපයුම්කාරිය මගින් 2019-10-10 වන දින Dahlia නම් නව මල් වර්ගය මිල දී ගැනීමට තීරණය කරන ලදී . ඉන් ඒකකයක් රු 2.50 බැගින් මිල දී ගන්නේ නම්,

(a) යාවත්කාලීන වන වගුව/වගු ලියා දක්වන්න.

(b) අදාල යාවත්කාලීන කිරීම් වලට අදාල නව රෙකෝඩය/රෙකෝඩ ලියා දක්වන්න.

(iii) Azalea නම් මල් වර්ගය මෙම කාර්තුව තුළ නුවරඑළිය ප්‍රදේශයෙන් සොයාගත නොහැකි බැවින් සමාගම එම මල් වර්ගය ලබා ගැනීම අතහැර දැමුවේ යැයි සිතන්න. මේ අනුව,

(a) යාවත්කාලීන වන වගුව/වගු ලියා දක්වන්න.

(iv) අදාල යාවත්කාලීන කිරීම් වලට අදාල නව රෙකෝඩය/රෙකෝඩ ලියා දක්වන්න.

03.

| | A | B | C | D | E | [redacted] | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | | ස්වදේශික සංචාරකයන් | | | | විදේශිකයන් | |
| 2 | සතිය | පැමිණි ළමුන් ගණන | ළමුන් ගෙන් ලැබුණු ආදායම | පැමිණි වැඩිහිටියන් ගණන | වැඩිහිටියන් ගෙන් ලැබුණු ආදායම | පැමිණි විදේශිකයන් ගණන | විදේශිකයන්ගෙන් ලැබුණු ආදායම |
| 3 | 1 | 1200 | රු. 18,000.00 | 500 | රු. 12,500.00 | 50 | රු. 15,000.00 |
| 4 | 2 | 2000 | රු. 30,000.00 | 1360 | රු. 34,000.00 | 300 | රු. 90,000.00 |
| 5 | 3 | 2300 | රු. 34,500.00 | 1200 | රු. 30,000.00 | 230 | රු. 69,000.00 |
| 6 | 4 | 1254 | රු. 18,810.00 | 800 | රු. 20,000.00 | 1000 | රු. 300,000.00 |
| 7 | ළමා ටිකට් පතක මිල | | රු. 15.00 | | | | |
| [redacted] | වැඩිහිටි ටිකට් පතක මිල | | රු. 25.00 | | | | |
| 9 | විදෙස් අය සඳහා ටිකට්පතක මිල | | රු. 300.00 | | | | |

එලිමහන් සතුන් වත්තක් නැරඹීම සඳහා පැමිණි දෙස් විදෙස් සංචාරකයන්ගෙන් උපයාගත් ආදායම දැක්වෙන ඉලෙක්ට්‍රෝනික පැතුරුම් පතක් ඉහත දැක්වේ.

(i) සති හතර තුළ දේශීය වැඩිහිටියන්ගෙන් ලබාගත් මුළු ආදායම E7 කෝෂයෙහි පෙන්වීම සඳහා ගැලපෙන ශ්‍රිතයක් ඇතුළත් සූත්‍රය ලියන්න.

(ii) ඔබ E7 හි ලියන ලද සූත්‍රය G7 කෝෂයට පිටපත් කළ විට එහි දර්ශනය වන සූත්‍රය ලියන්න.

(iii) ළමයින් සඳහා ටිකට්පත් විකිණීමෙන් පළමුවන සතියේ ලැබූ ආදායම සෙවීමට C3 කෝෂයෙහි ලිවිය යුතු සූත්‍රය කුමක් ද? (C3 හි ඔබ ලියන ලද සූත්‍රය ඇසුරින් අනෙකුත් සති වල ද ළමුන් සඳහා ටිකට්පත් විකිණීමෙන් ලැබූ ආදායම සොයාගත හැකි විය යුතුය)

(iv) කුමන හෝ සතියක් තුළ වැඩියෙන්ම පැමිණි විදේශිකයන් සංඛ්‍යාව සෙවීමට F7 කෝෂයෙහි ලිවිය යුතු තනි ශ්‍රිතය අඩංගු සූත්‍රය කුමක් ද?

(v) සති 4 තුළ පැමිණි නරඹන්නන් නිරූපණය කිරීමට භාවිතා කළ හැකි ප්‍රස්තාර වර්ග දෙකක් ලියන්න.


(එක් කොටසකට 2 බැගින් - ලකුණු 10)



ictnotes.org

Scanned with CamScanner

04. (i)




ක්‍රිකට් ක්‍රීඩාවේ රන්දෙවොල ලෙස සැලකෙන ලෝඩ්ස් ක්‍රීඩාංගනය ගැන තනන ලද වෙබ් පිටුවක් ඉහත දැක්වේ. එම වෙබ් පිටුව තැනීමට පාදක කර ගන්නා ලද HTML කේත පහතින් දක්වා ඇත. ඒ අනුව අංක 1 සිට 10 දක්වා දී ඇති හිස්තැන්වලට අදාල HTML කේතය දී ඇති පද ලැයිස්තුවෙන් තෝරා අදාල අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

HTML කේත ලැයිස්තුව

| - a, br, left, center, background, td, tr, th, cellpadding, img, h1, h4, hr, alt, ul, ol, dl, li, dd , P |
|---|

```
<html>
<head>
<title>Lords Cricket Ground< /title>
</head>
<body>
<1>
<2>Home of Cricket - Lords</2>
<3src='lords.jpg' a 4='Home of Cricket'
width='300' height='200' border='1'/>
</1>
<hr>
<4 align='justify'><b>Lord's Cricket
Ground,</b> headquarters and home
ground of the Marylebone Cricket
Club, long the world's foremost cricket
organization................</4>
<h2>World Cup Cricket Finals in Lords</h2>
<table border='1' cellpadding   "5">
<tr><5>Year<5><5>Winner<5></tr>
<tr><td>1975</td><td>West Indies</td></tr>
<tr><td>1979</td><td>West Indies</td></tr>
<tr><td>1983</td><td>India</td></tr>
<tr><td>1999</td><td>Australia</td></tr>
<tr><td>2019</td><td>England</td></tr>
</table>
<a href='https://www.lords.org/'>Find More about Lords
Ground</a>
</body>
</html>
```



ictnotes.org

Scanned with CamScanner

(ii) පහත දැක්වෙන්නේ බහුමාධ්‍ය භාවිතයෙන් නිර්මාණ සිදු කිරීමේදී භාවිතා වන මෘදුකාංග කිහිපයක ඇති මෙවලම් කිහිපයකි ඒවා භාවිතයෙන් පහත අසා ඇති ප්‍රශ්නවලට ගැලපෙන මෙවලම සහිත රූපයට අදාල ඉංග්‍රීසි අක්ෂරය අදාල ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.



A B C D E

i. ග්‍රාෆිකයක අනවශ්‍ය කොටස් ඉවත් කර ගැනීම සඳහා භාවිතා වේ ...............................


ii. සජීවිකරණ මෘදුකාංගයක භාවිතා වන ................මෙවලම මගින් වැඩතලය මත අඳින ලද හැඩතලවල බෝඩරය වෙනස් කළ හැකිය

iii. ග්‍රාෆිකයක තෝරාගත් කොටසක තට්ටුවක් ........... මෙවලම භාවිතයෙන් කරකැවිය හැකිය.

iv. ශ්‍රව්‍ය සන්ධාර සංස්කරණ මෘදුකාංගවල භාවිතා වන .........මෙවලම මගින් ශ්‍රව්‍ය පථයක ශබ්දය අඩු වැඩි කිරීම සිදුකළ හැකිය


v. ................මෙවලම මගින් සජීවි කරණ මෘදුකාංග වල නිර්මාණය කරන ලද හැඩතල හෝ හැඩතල එකතු කරන ලද රූපවල පරිමාණය වෙනස්කිරීම, කරකැවීම සහ හැඩතලය වෙනස් කිරීම සිදුකළ හැකිය.

05.




(i) ඉහත දැක්වෙන්නේ ශිෂ්‍යයන් 45 ක් සිටින 11 ශ්‍රේණිය පන්තියක ඔවුන්ගේ මුළු ලකුණු ආදානය කළ විට එය අදාල විෂයන් සංඛ්‍යාවෙන් බෙදා ලබා ගන්නා සාමාන්‍යය 35 ට වැඩි නම් සමත් බව දැක්වීම සඳහා අඳින ලද ගැලීම් සටහනක කොටසකි. එය සඳහා ගැලපෙන ව්‍යාජ කේතය ලියා දක්වන්න.

(ii) ශ්‍රී ලංකා රජය මගින් ලබා දෙනු ලබන රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට නම් මුලින්ම වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. ඉන් අනතුරුව ලිඛිත පරීක්ෂණයකින් සමත් විය යුතු අතර ඉන් අනතුරුව ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිට සමත් විය යුතුය. මෙම ප්‍රායෝගික පරීක්ෂණයට ඉදිරිපත් විය හැකි උපරිම වාර ගණන තුනක් වන අතර ඒ අවස්ථා අසමත් වුවහොත් නැවත මුල සිට පරීක්ෂණ වලට පෙනී සිටීමට සිදුවේ. ඉහත සංසිද්ධිය නිරූපණය සඳහා අඳින ලද ගැලීම් සටහනක් ඉහත දැක්වේ එහි A සිට E දක්වා හිස්තැන්වලට ගැලපෙන පිළිතුරු අදාල අක්ෂරය පිළිතුරු පත්‍රයෙහි ලියා ඉදිරියෙන් දක්වන්න.






ictnotes.org
Scanned with CamScanner

06 (i) මානවී පොලිතීන් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තශාලාවක හිමිකාරිණියකි. ඇය කර්මාන්ත ශාලාවේ සේවකයන් සඳහා වැටුප් ගෙවීම සිදුකිරීමත් කර්මාන්ත ශාලාවේ ප්‍රතිචක්‍රීකරණය සිදුවන ක්‍රියාවලියත් මේ දක්වා අත්යුරු (Manual) දත්ත පාදකයක් භාවිතයෙන් සිදු කරන ලදී. දැනට භාවිතා වන අත්යුරු දත්ත පාදකය පරිගණක ගත නව ස්වයංකරණ පද්ධතියක් වශයෙන් සකස්කිරීමට අදහස් කරයි. සේවක වැටුප් සැකසීම හා ප්‍රතිචක්‍රීකරණය නිවැරදිව සිදුකිරීමට අවශ්‍ය බැවින් ඒ සඳහා යෝග්‍ය පිහිටුවීමේ ක්‍රමයක් යෝජනා කිරීමට පාරමී වෙත පවරයි.

(a) නව පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා දියඇළි ආකෘතිය යොදාගැනීමට තීරණය කරන ලදී.
   (i) දිය ඇළි සංවර්ධන ක්‍රමය භාවිතයේ ඇති විය හැකි දුර්වලතාවයක් ලියන්න.
   (ii) දිය ඇළි අකෘතිය වැනි ඒ සඳහා යොදාගත හැකි වෙනත් විකල්පයක් දක්වන්න.

(b) නව පද්ධතිය ආයතනය වෙත හඳුන්වාදීමේ දී පාරමී විසින් ඇයට භාවිතා කළ හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(c) නව පද්ධතිය සැකසීමේ ක්‍රියාවලියේ පද්ධති විශ්ලේෂක වශයෙන් තෙවිඳු ක්‍රියා කළේ නම් නව පද්ධතියේ අවශ්‍යතා හඳුනාගැනීමට ඔහුට භාවිතා කළ හැකි ක්‍රම දෙකක් දක්වන්න .

(d) නව පද්ධතිය ආයතනයට හඳුන්වා දීමට ප්‍රථමයෙන් ඒහි දෝෂ පරීක්ෂාවක් සහ නිවැරදි කිරීමක් සිදු කළ යුතුය.
   (i) දෝෂ පරීක්ෂාව සඳහා යොදා ගන්නා ක්‍රමවේද ලියන්න.
   (ii) පද්ධතිය අදාළ පරිශීලකයන් මගින් පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා භාවිතා වන පරීක්ෂා කිරීමේ ක්‍රමය කුමක් ද ?

(ii) සෙව්ඳු, මානවී, හිරුණි සහ සසින්දි යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉගෙනුම ලබන්නේ ශ්‍රී ලංකාවේ පළාත් කිහිපයක ජනප්‍රිය පාසල්වලය. තොරතුරු තාක්ෂණික විෂයට අදාලව ක්‍රියාකාරමක් සඳහා ඔවුන් අතර මාර්ග ගත සාකච්ජාවක් සිදු කිරීමට සෙව්ඳු අපේක්ෂා කරයි.

(a) මෙම සාකච්ජාව මාර්ගතව ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයට සජීවීව සිදු කිරීමට යොදාගත හැකි තාක්ෂණික ක්‍රමයක් නම් කරන්න.

(b) ඉහත තාක්ෂණික ආකාරය යොදා ගැනීමේ දී ඔවුන්ට මුහුණපෑමට සිදුවන එක් ගැටලුවක් දක්වන්න

(c) ඉහත දැක්වූ තාක්ෂණික ආකාරයට අමතරව දුරස්ථ පුද්ගලයන් හෝ කණ්ඩායම් අතර සන්නිවේදනය සිදු කරගත හැකි තාක්ෂණික ආකාර දෙකක් ලියන්න.

07 තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රය වර්තමානය වන විට මිනිසාට අත්‍යවශ්‍ය අංගයක් වී ඇති අතර බොහෝ මානව ක්‍රියාකාරකම් වලට විසඳුම් ලබා ගන්නේ ද තොරතුරු හා සන්නිවේදනය මගිනි. නමුත් සමහර අවස්ථා වල දී එමගින් අහිතකර ප්‍රතිඵල ද අත්වූ අවස්ථා බොහොමයක් වන අතර භාවිතයේ දී විවිධ ගැටලු රැසකට මුහුණ දීමට ද සිදුව තිබේ. වර්තමාන රැකියා අවස්ථාවන් බොහොමයක් මෙම ක්ෂේත්‍රය ඔස්සේ නිර්මාණය වී තිබීමෙන් පාසල් සිසුන් ද වැඩි වශයෙන් තොරතුරු හා සන්නිවේදන විෂය ඉගෙනීමට නැඹුරුතාවයක් දක්වයි.
තොරතුරු හා සන්නිවේදන ක්ෂ්ත්‍රයේ දී,

(i) මෘදුකාංග හෝ තොරතුරු අන්සතු වීමෙන් රටක ඇතිවිය හැකි ගැටලු දෙකක් ලියන්න.

(ii) බුද්ධිමය දේපළක නෛතික ආරක්ෂාව සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාදාමය කුමක්ද?


(iii) ශ්‍රී ලංකාවේ අන්තර්ජාල තොරතුරු හුවමාරුව සඳහා ශ්‍රී ලංකාව තුළ ආරක්ෂාව සපයන ආයතනයක් නම් කරන්න.

(iv) ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ආරක්ෂාකාරීව බැහැර කිරීමට හැකි සුදුසු ක්‍රම තුනක් ලියන්න.

(v) ප්‍රාදේශීය වශයෙන් සොයා ගන්නා ලද දුර්ලභ මසුන් ගේ ව්‍යාප්තිය දැක්වීම සඳහා නිමල් විසින් සකස් කරනලද සමර්පණයේ හිස් පිරිසැලසුම් (blank layout) කදාවක් යොදගෙන විශේෂ මාලුවෙකු ගේ රූපයක් ඇතුළත් කර ඇත.

(a) එම කදාවට මාලුවාගේ විද්‍යාත්මක නාමය ඇතුළත් කිරීම සඳහා දැන් ඔහුට ගතහැකි ක්‍රියාමාර්ගයක් ලියා දක්වන්න.

(b) තවත් කදාවක් සඳහා ඔහු විසින් දකුණුපස දැක්වෙන පිරිසැලසුම යොදාගෙන පසුගිය වසර 10ක එක් එක් මත්ස්‍යයන්ගේ ව්‍යාප්තිය දැක්වෙන සංඛ්‍යාත්මක තොරතුරු ඇසුරෙන් ප්‍රස්තාරයක් ඇතුළත් කිරීමට අදහස් කරයි. ඔහුට මෙම ප්‍රස්තාරය ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු පියවර ලියා දක්වන්න.


Blank


Title and Content



ictnotes.org

Scanned with CamScanner